258, එම්. වින්සන්ට් පෙරේරා මාවත
කොළඹ14
0114700800

# යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම Youth Focus Corporate සම්මානයෙන් පිදුම් ලබයි

***2022 New Generation සම්මාන උළෙලේදී ශ්‍රී ලාංකේය තරුණ තරුණියන් සවිබල ගැන්වීම වෙනුවෙන් යුනිලිවර් සමාගමේ කැපවීම පිළිගැනීමට ලක් වෙයි***

**2022 දෙසැම්බර් 12, කොළඹ -** යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම 2022 New Generation සම්මාන උළෙලේදී Youth Focus Corporate සම්මානයෙන් පිදුම් ලැබීමට පසුගියදා සමත් විය. ඒ ආයතනයක් ලෙස යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම 2021 - 2022 කාලය තුළ ශ්‍රී ලංකාවේ තාරුණ්‍යය බලගැන්වීම වෙනුවෙන් ඉටුකල සුවිසල් කාර්යභාරය ඇගයීමට ලක් කිරීම වෙනුවෙනි. ශ්‍රී ලංකා තරුණ සේවා සභාව සමඟ එක්ව Women in Management සංවිධානයේ නව පරපුරේ කාන්තා කළමනාකරණ අංශය විසින් සංවිධානය කරනු ලැබූ මෙම සම්මාන උළෙලේදී පිරිනමනු ලැබූ එකම ආයතනික සම්මාන කාණ්ඩය වූයේද මෙයයි.

දක්ෂ තරුණ ශ්‍රී ලාංකිකයින් හඳුනා ගැනීම, ඔවුන් දිරි ගැන්වීම හා ඔවුන් ඉහළ තත්වයකට ගෙන ඒම සහ ජාතිය වෙනුවෙන් ඔවුන් දක්වන දායකත්වය ඇගයීමට ලක් කිරීම අරමුණු කොට ගත් මෙම සම්මාන උළෙලේදී පාසල් සිසුන්, තරුණ ව්‍යවසායකයන්, පාසල් හා ආයතන ඇතුළු කාණ්ඩ 20ක් වෙනුවෙන් සම්මාන 50කට අධික සංඛ්‍යාවක් පිරිනමනු ලැබීය.

යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම වෙත හිමි වූ මෙම සුවිශේෂී සම්මානය පිළිබඳව අදහස් දැක්වූ **යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ මානව සම්පත් අධ්‍යක්ෂිකා අනන්‍යා සභාර්වල් මහත්මිය** *''ශ්‍රී ලාංකේය තරුණ තරුණියන්ගේ හැකියාවන් ඉහළ නැංවීම සඳහා වන අපගේ කැපවීම ඇගයීමට ලක් කරමින් මෙම සම්මානය අප වෙත හිමිවීම පිළිබඳව ඉතාමත් සතුටට පත් වෙනවා. යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම උපාධි අපේක්ෂකයින් වෙනුවෙන් නම්‍යශීලී හා කෙටි කාලීන වැඩසටහන් හඳුන්වා දීමට කටයුතු කර තිබෙනවා. ඒ තුළින් ඔවුන් උපාධිය ලබා ගන්නා විට වෘත්තීය ජීවිතය වෙනුවෙන් ශක්තිමත් පදනමක් සකසා ගැනීමට අවශ්‍ය හැකියාවන් හා ආයතනික අත්දැකීම් ලබා ගැනීමට ඔවුන්ට හැකිවී තිබෙනවා. අපගේ හැකියාවන්ගෙන් පිරිපුන් තරුණ සේවක ප්‍රජාව විසින් විශ්වවිද්‍යාල සැසි හරහා ඔවුන්ගේ අත්දැකීම් බෙදාහදා ගැනීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙමින් තාරුණ්‍යය ශක්තිමත් කිරීමේ යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ කැපවීමට සාමූහිකව දායකත්වය ලබා දෙනවා. මේ ආකාරයේ ඔවුන්ගේ ක්ෂේත්‍ර අත්දැකීම් බෙදා ගැනීම තුළින් තරුණ තරුණියන්ට තමන් කැමති වෘත්තියක නියැලීමේ හැකියාව උදා කරදෙනු ඇති බව නිසැක වශයෙන්ම සඳහන් කළ හැකියි''* යනුවෙන් පවසා සිටියාය.

2025 වසර වන විට ශ්‍රී ලාංකේය තරුණ තරුණියන් 100,000ක් අත්‍යාවශ්‍ය කුසලතාවන්ගෙන් සවිබල ගැන්වීමට මෙන්ම ඔවුන් හැකියාවන්ගෙන් පිරිපුන් පිරිසක් බවට පත් කිරීමට කැපවී කටයුතු කරන යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම විශ්වවිද්‍යාල වැඩසටහන්, උපාය මාර්ගික කර්මාන්ත - අධ්‍යයන ශිෂ්‍ය සබඳතා සහ වෘත්තීය අවස්ථා තුළින් පසුගිය වසර 5ක කාලය තුළ දේශීය තරුණ තරුණියන් 30,000කට අධික පිරිසක් වෙත රැකියා අවස්ථාවන් උදා කර දීමට සමත් වී ඇත. බොහෝ තරුණ වැඩසටහන් සඳහා පාදක වන එහි SPARKS ශිෂ්‍ය තානාපති වැඩසටහන තුළින් තමන්ගේ විශ්වවිද්‍යාලයේ තානාපතිවරුන් ලෙස කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම විශ්වවිද්‍යාලන්හි ඉගෙනුම ලබන උපාධි අපේක්ෂකයින් වෙත අවස්ථාව ලබා දෙයි. තවද ප්‍රමුඛ පෙළේ සන්නාම සමඟ එක්ව කටයුතු කිරීමේ හා මනා චින්තනයක් ගොඩනැංවීමේ අත්දැකීම ද ලබා දෙන සන්නාම කේන්ද්‍රකොට ගත් සිද්ධි අධ්‍යයන (Case Study) තරඟයක් ලෙස යුනිලිවර්හි Unilever Challenge හඳුන්වා දිය හැකිය. යුනිලිවර් සීමාවාසික නායකත්ව වැඩසටහන තුළින් උපාධි අපේක්ෂකයින් වෙත සීමාවාසික අවස්ථාවන් ලබා දීමද මෙහි තවත් එක් පියවරක් ලෙස

පෙන්වා දිය හැකිය. විශේෂිතම කරුණක් වන්නේ ඒ ආකාරයෙන් කොන්ත්‍රාත් පදනම මත සමාගමට සම්බන්ධ කරගත් සේවකයින්ගෙන් 48%ක් පමණ සිය කළමනාකරණ තනතුරු සඳහා එක් කර ගැනීමට යුනිලිවර් ශ්‍රී ලංකා ආයතනය කටයුතු කර තිබීමයි.

අද වන විට බෙහෙවින් දැකිය හැකි මෙරට බුද්ධි ගලන ප්‍රවණතාවන් අවම කරමින් තරුණ සේවා නියුක්තිය ඉහළ නැංවීම හා අනාගත හැකියාවන් ඔප් නැංවීම වෙනුවෙන් යුනිලිවර් සමාගම, ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් (John Keells Holdings) සහ ලන්ඩන් කොටස් වෙළෙඳපොල සමූහය (London Stock Exchange Group) සමඟ එක්ව 'Fast-Track' නමින් දේශීයව හා විදේශගතව අධ්‍යාපනය ලබන ශ්‍රී ලාංකික සිසුන් වෙනුවෙන් බහුවිධ ක්ෂේත්‍රයන් තුළ නවමු රැකියා අත්දැකීමක් ලබා දීමේ පුහුණු වැඩසටහන දියත් කොට ඇත. එසේම කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනය (CIMA) , ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT ), ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය (KDU) AIESEC ශ්‍රී ලංකා සහ Gavel clubs සමඟ එක්ව ශ්‍රී ලාංකේය තරුණ තරුණියන්ගේ සුවිශේෂී හැකියාවන් ඔප් නැංවීමට දායකත්වය දක්වා ඇත.

~අවසන්~